# පාසල් පාදක තක්සේරුකරණය ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල ක්‍රියාත්මක වන ආකාරය (8 සහ 9 ශ්‍රේණි ඇසුරෙන්)

කොලොන්නේ විමලධම්ම හිමි[1], මඩුගල්ලේ සුදත්ත හිමි[2], වරාගම ඥානරතන හිමි[3]

## හැඳින්වීම

නූතන අධිවේගී ගෝලීයකරණය තුළ සිසුන් නිපුණතා සාක්ෂාත් කරගන්නේදැ'යි විමසීම ප්‍රධාන අභියෝගයකි. සාම්ප්‍රදායික විභාග කේන්ද්‍රීය ක්‍රමය සිසුන් ආතතියට හා තරඟකාරීත්වයට නතු කරමින් ඔවුන්ගේ සහජ කුසලතා සහ නිර්මාණශීලීත්වය අඩාල කරයි. මෙයට පිළියමක් ලෙස ආතතියෙන් තොර හිතකාමී ඇගයීම් සංස්කෘතියක් උදෙසා 'පාසල් පාදක තක්සේරුකරණය' (SBA) ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වලට හඳුන්වා දෙන ලදි. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ 8 සහ 9 ශ්‍රේණි කේන්ද්‍ර කරගනිමින් SBA ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන ආකාරය සහ එහි ඵලදායිත්වය විමර්ශනය කිරීමයි. හුදෙක් ප්‍රජානන සංවර්ධනයට පමණක් සීමා වූ විභාග රටාවෙන් අධ්‍යාපනයේ ගුණාත්මකභාවයට වන හානිය වළක්වා ගැනීමට SBA සතු දායකත්වය අධ්‍යයනය කරන අතර මෙය ප්‍රතිපත්ති සම්පාදකයින්ට, පරිපාලකයින්ට හා ගුරුවරුන්ට වැදගත් නිර්දේශ සපයයි.

## පර්යේෂණයේ සුවිශේෂී අරමුණු

1. පාසල් පාදක තක්සේරුකරණය පිළිබඳ සෛද්ධාන්තික සහ චක්‍රලේඛීය පදනම හඳුනා ගැනීම
2. රජයේ පාසල්වල වත්මන් පාසල් පාදක තක්සේරුකරණ ක්‍රියාවලියේ ස්වභාවය විමර්ශනය කිරීම
3. තක්සේරුකරණ ක්‍රියාවලිය සිසුන්ගේ නිපුණතා සංවර්ධනය කෙරෙහි බලපාන ආකාරය අධ්‍යයනය කිරීම
4. පවතින ප්‍රායෝගික ගැටලු සහ බාධක හඳුනාගෙන, එම ක්‍රියාවලිය වඩාත් ඵලදායී ලෙස සංවර්ධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම

## සාහිත්‍ය විමර්ශනය

නව ගෝලීය අධ්‍යාපන ප්‍රවණතා සමඟ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මකභාවය අඛණ්ඩව නැංවීම උදෙසා 'පාසල් පාදක තක්සේරුකරණය' හඳුන්වා

1 අධ්‍යාපනවේදී, සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය. vimaladamma1999@gmail.com

2 කථිකාචාර්ය, සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය. sudaththam@busl.ac.lk

3 තාවකාලික කථිකාචාර්ය, සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය. wgnanarathana@busl.ac.lk

දෙන ලදි. ගිනිගේ (2019) පෙන්වා දෙන පරිදි මෙය සාම්ප්‍රදායික ඇගයීමෙන් බැහැර වූ ශිෂ්‍යයාට සමීප අඛණ්ඩ ප්‍රතිපෝෂණ සපයන ප්‍රායෝගික ක්‍රමවේදයකි. මෙහි දී ගුරුවරයා ශිෂ්‍ය-කේන්ද්‍රීය මාර්ගෝපදේශකයෙකු ලෙස ක්‍රියා කරයි (ජාතික අධ්‍යාපන ආයතනය, 2009). ලොව පුරා 21 වන සියවසේ මෘදු කුසලතා සංවර්ධනයට මෙය බහුලව යොදා ගැනේ. ඒ අනුව ෆින්ලන්තය සහ කැනඩාව වැනි රටවල් සම්භවන ප්‍රතිපෝෂණ ද (Formative Feedback), හොංකොං සහ සිංගප්පූරුව ව්‍යාපෘති පාදක ක්‍රමවේද ද ජාතික ඇගයීම් සමඟ සාර්ථකව බද්ධ කර ඇත (Sachith & Niranjanie, 2025).

ශ්‍රී ලංකාවේ මෙහි ආරම්භය 1981 'අඛණ්ඩ ඇගයීම' දක්වා දිවෙන අතර 1998 දී නිල වශයෙන් SBA හඳුන්වා දී 2007 නිපුණතා පාදක අධ්‍යාපනය සමඟ තවදුරටත් තහවුරු විය (Wijeratne, 2021). කෙසේ වෙතත් ශ්‍රී ලංකාව තුළ මෙහි ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය පිළිබඳ ගැටලු ලෙස ගුරුවරුන් ඇගයීම් මෙවලම් නිර්මාණයට දක්වන දුර්වලතා (NEC, 2014), දැඩි විභාග කේන්ද්‍රීය මානසිකත්වය සහ වාර විභාගවලට පමණක් ප්‍රමුඛතාව දීම (Senarath, 2020), ගුරුවරුන්ගේ අධික සේවා බර, පුහුණුව නොමැතිකම ආදි පවතින බව පර්යේෂකයෝ පෙන්වා දෙති (Sachith & Niranjanie, 2025). නිලධාරී සහය නොලැබීම සහ විභාග පීඩනය නිසා ගුරුවරුන් ප්‍රායෝගික ක්‍රමවලින් ඈත් වන බව කරුණාරත්න (2015) පෙන්වා දෙයි. ඒ අනුව ඇගයීම පිළිබඳ විවිධ පර්යේෂණ ගණනාවක් සිදු කර ඇත. ඒ අතර මෙම පර්යේෂණය සිදු වන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසල් දෙකක 8 සහ 9 ශ්‍රේණි පාදක කර ගෙන නිසාවෙන් මෙය සුවිශේෂ වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳහා 'මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය' භාවිත කරන ලදි. මෙම පර්යේෂණය සඳහා උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, අනුරාධපුර කලාපයේ, අනුරාධපුර කොට්ඨාසයට අයත් රජයේ පාසල් දෙකක් ඇසුරෙන් අසම්භාවිත සාරම්මන නියැදීම් ක්‍රමවේදය (Purposive Sampling) යටතේ නියැදිය තෝරාගත් අතර ඊට අදාළ පාසල් දෙකෙහි විදුහල්පතිවරුන් දෙදෙනෙකු, 8 සහ 9 ශ්‍රේණි භාර අංශ ප්‍රධානීන් දෙදෙනෙකු, එක් පාසලකින් 10 බැගින් වූ එම ශ්‍රේණිවල උගන්වනු ලබන විෂයභාර ගුරුවරුන් 20 දෙනෙකු සහ එක් පන්තියකින් සිසුන් 10 දෙනෙකු බැගින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 40 දෙනෙකු නියැදියට ඇතුළත් විය. මෙහි දී දත්ත රැස්කිරීමේ මෙවලම් ලෙස ව්‍යුහගත ප්‍රශ්නාවලි, අර්ධ-ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා සහ පන්ති කාමර නිරීක්ෂණ යොදාගත් අතර එසේ රැස්කරගත් ගුණාත්මක දත්ත තේමා විශ්ලේෂණය මඟින් ද ප්‍රමාණාත්මක දත්ත සරල ප්‍රතිශත ඇසුරෙන් විස්තරාත්මක සංඛ්‍යානය මඟින් ද විශ්ලේෂණයට භාජනය කරන ලදී.

**පර්යේෂණයේ සීමා**

මෙම අධ්‍යයනය පාසල් දෙකක 8 සහ 9 ශ්‍රේණිවලට පමණක් සීමා වන බැවින් මෙහි සොයා ගැනීම් සමස්ත ලංකාවේම රජයේ පාසල් පද්ධතියේ පොදු තත්ත්වය ලෙස සාමාන්‍යයිකරණය කළ නොහැකි අතර එය මෙම පර්යේෂණයේ පවතින ප්‍රධාන සීමාවකි.

## දත්ත විශ්ලේෂණය සහ සාකච්ඡාව

### රජයේ පාසල් තුළ SBA ක්‍රියාත්මක වීමේ චක්‍රලේඛීය පදනම

අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 23/2017 චක්‍රලේඛයට අනුව 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සියලු ම පන්තිවල උගන්වනු ලබන සෑම විෂයයක් සඳහා ම පාසල් වාරයකට අවම වශයෙන් එක් තක්සේරුකරණ අවස්ථාවක් හෝ ක්‍රියාත්මක කිරීම අනිවාර්ය වේ. 8 සහ 9 ශ්‍රේණි සඳහා නියමිත නිපුණතා මට්ටම් තීරණය කිරීමට වාරයක් තුළ එක් එක් විෂයයන්ට අදාළ වන අවම තක්සේරුකරණ අවස්ථා සංඛ්‍යාව 1 බැගින් වන බව චක්‍රලේඛයේ පැහැදිලිව දක්වා ඇත. කෙසේ වෙතත් සිසුන්ගේ නිපුණතා මට්ටම් සැලකිල්ලට ගනිමින් ගුරුවරයාගේ අභිමතය පරිදි ඊට වඩා වැඩි අවස්ථා ගණනක් වුවද සැලසුම් කළ හැකි ය.

### පරිපාලකයන්ගේ අදහස් සහ නියාමන පද්ධතිය

පර්යේෂණ දත්තවලට අනුව පාසල් දෙකෙහිම විදුහල්පතිවරුන් තුළ පාසල් පාදක තක්සේරුකරණය පිළිබඳව මනා ශාස්ත්‍රීය හා ප්‍රායෝගික අවබෝධයක් පවතී. ඔවුන් SBA ක්‍රියාවලිය දකින්නේ සිසුන්ගේ අධ්‍යාපන මට්ටම මැනිය හැකි සාධාරණ, නම්‍යශීලී සහ පීඩනයෙන් තොර ක්‍රමයක් ලෙසයි.

පාසල් තුළ මෙම ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා විධිමත් අභ්‍යන්තර නියාමන පද්ධතියක් ක්‍රියාත්මක වේ. එක් පාසලක නියෝජ්‍ය විදුහල්පති (සංවර්ධන) විසින් ද අනෙක් පාසලේ 8-9 අංශ භාර සහකාර විදුහල්පති සහ ජ්‍යෝෂ්ඨ අංශ ප්‍රධානීන් විසින් ද මෙම කටයුතු සම්බන්ධීකරණය කරනු ලබයි. බාහිර නියාමනය යටතේ කොට්ඨාස, කලාප සහ පළාත් අධ්‍යාපන නිලධාරීන් හා ගුරු උපදේශකවරුන් පාසල් මට්ටමින් මැදිහත් වෙමින් ලකුණු ලේඛන පරීක්ෂාවට ලක් කරයි.

අංශ ප්‍රධානීන්ගේ අදහස් අනුව ඔවුන්ගේ අධීක්ෂණයේ දී කිසිදු දරුවෙකුට ලකුණු 5කට වඩා අඩුවෙන් නොලැබීමටත්, සෑම දරුවෙකු ම ඇගයීමට ලක්වන බව තහවුරු කර ගැනීමටත් විශේෂ අවධානයක් යොමු කෙරේ. කෙසේ වෙතත් එක් පාසලක නියාමන තත්ත්වය සාර්ථක මට්ටමක පවතින අතර අනෙක් පාසලේ පවතින තත්ත්වයට වඩා තවදුරටත් එය විධිමත් විය යුතු බව හඳුනා ගැනිණි.

### ගුරුවරුන්ගේ අවබෝධය සහ භාවිත වන තක්සේරු ප්‍රභේද

පර්යේෂණයට සහභාගී වූ බහුතරයක් ගුරුවරුන් තුළ චක්‍රලේඛ පිළිබඳ අවබෝධය යහපත් මට්ටමක පැවති අතර දුර්වල අවබෝධයක් ඇති ගුරුවරුන් හමු නොවී ය. පාසල් පරිපාලනය මඟින් ඇගයීම් සැලසුම් ආකෘති පත්‍ර, උපකරණ සැපයීම සහ දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා ගුරුවරුන්ට ඉහළ සහයෝගයක් ලබා දෙන බැවින් ගුරුවරුන් මේ පිළිබඳ තෘප්තිමත් වේ. ගුරුවරුන් පන්ති කාමරය තුළ බහුලව ම  භාවිත කරන තක්සේරුකරණ ප්‍රභේද පිළිබඳ විමසීමේ දී ලැබුණු ප්‍රතිඵල පහත වගුවේ දැක් වේ.

වගුව 01: ගුරුවරුන් පන්ති කාමරය තුළ බහුලවම භාවිත කරන තක්සේරුකරණ ප්‍රභේද

| තක්සේරුකරණ ප්‍රභේදය | ගුරුවරුන් භාවිත කරන ප්‍රතිශතය |
|---|---|
| පැවරුම් (Assignments) | 63% |
| කණ්ඩායම් ක්‍රියාකාරකම් (Group Activities) | 10% |
| ප්‍රායෝගික ක්‍රියාකාරකම් (Practical Activities) | 5% |
| වෙනත් විවිධ ක්‍රම (Other Methods) | 5% |
| ස්ව නිර්මාණ (Creative Creations) | 3% |
| ගවේෂණ (Explorations & Research) | 2% |
| කිසිදු ක්‍රමයක් භාවිත නොකරන ප්‍රමාණය | 12% |

(මූලාශ්‍රයඃ පර්යේෂණ දත්ත, 2025)

SBA මාර්ගෝපදේශ සංග්‍රහය මඟින් ව්‍යාපෘති, ක්ෂේත්‍ර චාරිකා, විවාද, භූමිකා රංගන, සංකල්ප සිතියම්, ශ්‍රවණ සහ වාචික පරීක්ෂණ වැනි විවිධාංගීකරණය වූ ප්‍රභේද රැසක් යෝජනා කර තිබුණ ද ගුරුවරුන් තවමත් සාම්ප්‍රදායික ලිඛිත 'පැවරුම්' ක්‍රමය (63%) කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වන බව මෙමඟින් පැහැදිලි වේ. මෙයට හේතුව වන්නේ අනෙකුත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා වැඩි කාලයක් සහ වෙහෙසක් දැරීමට සිදු වීමයි.

**ප්‍රතිපත්ති සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් අතර පරස්පරතාව**

මෙම පර්යේෂණයේ දී අනාවරණය වූ වැදගත්ම සොයා ගැනීම වන්නේ පරිපාලනයේ ප්‍රකාශ සහ සිසුන්ගේ සැබෑ පන්ති කාමර අත්දැකීම් අතර පවතින දැඩි පරස්පරතාවයි.

පරිපාලන අංශ (විදුහල්පතිවරුන් සහ අංශ ප්‍රධානීන්) ප්‍රකාශ කරන්නේ සෑම දරුවෙකුම සෑම විෂයකින්ම අනිවාර්යයෙන් ම නිසි පරිදි ඇගයීමට ලක්වන බවයි. නමුත් 8 සහ 9 ශ්‍රේණිවල සිසුන් 40 දෙනාම සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවල දී සිසුන් ප්‍රකාශ කළේ සෞඛ්‍යය සහ ශාරීරික අධ්‍යාපනය, විද්‍යාව, ආගම, ඉතිහාසය, සිංහල, චිත්‍ර සහ පුරවැසි අධ්‍යාපනය වැනි විෂයන් සඳහා බහුලව ඇගයීම් සිදු වුව ද ගණිතය සහ ඉංග්‍රීසි වැනි ප්‍රධාන විෂයයන් රැසක් සඳහා තක්සේරුකරණ අවස්ථා නොලැබෙන බවයි.

මෙම 'ප්‍රතිපත්ති සහ ප්‍රායෝගික පරස්පරතාව' ඇති වීමට බලපා ඇති ප්‍රධාන හේතු සාධක දෙකක් විචාරාත්මකව හඳුනාගත හැකි ය.

1. තක්සේරු නොකර ලකුණු වාර්තාකරණය පමණක් සිදු කිරීම: නිල වශයෙන් විධිමත් තක්සේරුකරණ අවස්ථා පන්ති කාමරය තුළ ක්‍රියාත්මක නොකර අනුමාන ලකුණු ඇතුළත් කිරීමේ ප්‍රවණතාවයක් පැවතීම

2. ශිෂ්‍ය අවබෝධය අවම වීම: ගුරුවරයා පන්ති කාමරය තුළ සිදුකරන ඇතැම් සාමාන්‍ය ක්‍රියාකාරකම් (උදා: පැවරුම් හෝ කෙටි ප්‍රශ්න) SBA අවස්ථාවක් ලෙස ලකුණු පොතට ඇතුළත් කළ ද එය තමන්ව ඇගයීමට ලක් කළ සුවිශේෂී අවස්ථාවක් බව සිසුන් නිවැරදිව වටහාගෙන නොසිටීම

**නිපුණතා සාධනය කෙරෙහි SBA හි බලපෑම**

සාම්ප්‍රදායික නීරස ඉගෙනුම් රටාව වෙනුවට පාසල් පාදක තක්සේරුකරණය සිසුන්ගේ චින්තන, අන්තර්-පුද්ගල (සමාජීය) සහ පුද්ගල කුසලතා වර්ධනයට සෘජුවම දායක වන බව පර්යේෂණයේ දී තහවුරු විය. සිසුන් ප්‍රකාශ කළේ තමන් ඉතා තෘප්තිමත් ලෙස අන්තර්ජාලය, පුවත්පත් සහ සඟරා පරිශීලනය කරමින් තක්සේරුකරණ සඳහා තොරතුරු සොයන බවයි. කණ්ඩායම් ක්‍රියාකාරකම් සහ ප්‍රශ්න විචාරාත්මක තරඟ නිසා තමන්ට පාඩම් වැඩ අමතක නොවන බවත්, අලස බවින් තොරව විනෝදාත්මක ලෙස ඉගෙන ගත හැකි බවත් සිසුන් පෙන්වා දුන්හ. මෙයින් පැහැදිලි වන්නේ සිසුන් විභාග සංස්කෘතියට වඩා පාසල් පාදක තක්සේරුකරණ ක්‍රියාවලියට බෙහෙවින් ඇලුම් කරන බවයි.

**පවතින ප්‍රායෝගික අභියෝග**

රජයේ පාසල් පද්ධතිය තුළ පාසල් පාදක තක්සේරුකරණය එහි උපරිම ඵලදායීත්වයෙන් ක්‍රියාත්මක වීමට ප්‍රධාන බාධක කිහිපයක් හරස් වී ඇත.

- කාල කළමනාකරණය පිළිබඳ ගැටලුව: නියමිත කාලය තුළ අධික විෂය නිර්දේශය ආවරණය කිරීමට සිදුවීම නිසා ගුරුවරුන්ට විධිමත් තක්සේරුකරණ අවස්ථා සඳහා කාලය වෙන් කිරීම අපහසු වී ඇත.

- සම්පත් ප්‍රමාණවත් නොවීම: ප්‍රායෝගික ක්‍රියාකාරකම්, ගවේෂණ සහ නව නිපැයුම් සඳහා අවශ්‍ය ද්‍රව්‍යමය, භෞතික හා මූල්‍යමය සම්පත් පාසල් සතුව නොතිබීම.

- ශිෂ්‍ය පැමිණීමේ දුර්වලතා: ඇතැම් සිසුන් පාසල් නොපැමිණීම නිසා ඔවුන් අඛණ්ඩ තක්සේරුවෙන් සහ ප්‍රතිපෝෂණ ක්‍රියාවලියෙන් සම්පූර්ණයෙන්ම ගිලිහී යාම.

- තාක්ෂණික දුර්වලතා: නූතන තොරතුරු තාක්ෂණික මෙවලම් භාවිත කරමින් ගවේෂණාත්මක ඇගයීම් කිරීමට ගුරුවරුන්ට සහ සිසුන්ට පවතින තාක්ෂණික හා යටිතල පහසුකම් අවම වීම.

- ලිඛිත ක්‍රමවලට පමණක් සීමා වීම: කුසලතා සහ ආකල්ප මැනීම පසෙක ලා පහසුව තකා ලිඛිත පැවරුම් පමණක් බහුලව යොදා ගැනීම.

## නිගමනය සහ යෝජනා

### නිගමනය

මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයට අනුව නිගමනය කළ හැක්කේ පාසල් පාදක තක්සේරුකරණ ක්‍රියාවලිය සිසුන්ගේ නිපුණතා සාක්ෂාත් කර ගැනීම සඳහා අතිශයින් ම වැදගත් සහ ඵලදායී මෙවලමක් වන බවයි. සිසුන් සාම්ප්‍රදායික ලිඛිත විභාගවලට වඩා මෙම ක්‍රමවේදයට කැමැත්තක් දක්වන්නේ එය ආතතියෙන් තොර තෘප්තිමත් ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කරන බැවිනි. කෙසේ වෙතත් ගුරුවරුන් පහසුව තකා බහුලවම භාවිත කරන ලිඛිත පැවරුම් ක්‍රමය නිසා සිසුන්ගේ ප්‍රායෝගික කුසලතා, ආකල්ප සහ සමාජීය හැකියා වර්ධනය අඩාල වේ. එම නිසා වත්මන් ක්‍රියාවලියේ පවතින ප්‍රායෝගික අක්‍රමිකතා සහ බාධාවන් ඉවත් කරමින් අපේක්ෂිත අධ්‍යාපනික අරමුණු ළඟා කර ගැනීම සඳහා වඩාත් විධිමත් 'සුනත්‍ය තක්සේරුවක්' (Authentic Assessment) පන්ති කාමරය තුළ ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය බව නිගමනය කළ හැකි ය.

### යෝජනා

- **ඇගයීම් විවිධාංගීකරණය:** ලිඛිත පැවරුම්වලට පමණක් සීමා නොවී ක්ෂේත්‍ර චාරිකා, විවාද සහ ව්‍යාපෘති වැනි ප්‍රායෝගික ක්‍රම භාවිත කිරීම
- **ගුරු පුහුණුව:** තක්සේරුකරණ නිර්ණායක සහ ප්‍රතිපෝෂණ ලබාදීමේ නිවැරදි ක්‍රමවේද පිළිබඳව කලාප මට්ටමින් අඛණ්ඩ වැඩමුළු පැවැත්වීම
- **සම්පත් සංවර්ධනය:** ප්‍රායෝගික හා ගවේෂණාත්මක ඇගයීම් සඳහා අවශ්‍ය විද්‍යාගාර, පුස්තකාල සහ තාක්ෂණික මෙවලම් රජය මැදිහත් වී සැපයීම
- **පාර්ශවකරුවන් දැනුවත් කිරීම:** ඇගයීම් සිදුකරන නිර්ණායක පිළිබඳව සිසුන්ට මෙන් ම දරුවන්ගේ නිර්මාණශීලීත්වයට සහය දීමට දෙමාපියන් ද දැනුවත් කිරීම
- **අධීක්ෂණය ශක්තිමත් කිරීම:** සියලුම සිසුන්ට සමසේ ඇගයීම් අවස්ථා ලැබෙන්නේදැයි සොයා බැලීමට අභ්‍යන්තර පරිපාලනය සහ බාහිර ගුරු උපදේශකයින් ලකුණු ලේඛන හා වැඩගොනු විධිමත් ලෙස නිරීක්ෂණය කිරීම

**ප්‍රමුඛ පද** - තක්සේරුකරණය, නිපුණතා සාධනය, පාසල් පාදක තක්සේරුකරණය, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය, සුනත්‍ය තක්සේරුව

### ආශ්‍රිත ග්‍රන්ථ

අධ්‍යාපන අමාත්‍යාංශය. (2017). පාසල පදනම් කරගත් තක්සේරුකරණය: 6-13 ශ්‍රේණි සඳහා වර්ෂ 2017 සහ ඉන් ඉදිරියට ක්‍රියාත්මක කිරීම පිළිබඳ චක්‍රලේඛය (අංක 23/2017). බත්තරමුල්ල: අධ්‍යාපන අමාත්‍යාංශය.

ගිනිගේ, ඉ. ලී. (2019). *නව ඉගෙනුම් - ඉගැන්වීම් ප්‍රවේශය තුළ තක්සේරුව හා ඇගයීම.* කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ජාතික අධ්‍යාපන ආයතනය. (2009). *පාසල් පාදක තක්සේරුකරණය ක්‍රියාත්මක කිරීමේ අත්පොත.* මහරගම: ජාතික අධ්‍යාපන ආයතනය.

විභාග දෙපාර්තමේන්තුව. (2018). *පාසල් පාදක තක්සේරුකරණය සහ පොදු පරීක්ෂණ.* බත්තරමුල්ල: ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

Asian Development Bank [ADB]. (2014). *Education Sector Development Program - Sector Assessment: Education*.

Clausen, J. (1968). *Socialization and Society*. Boston: Little, Brown and Company.

Karunaratne, S. (2015). *Using school based assessment to improve teaching and learning*. *Journal of the University of Peradeniya*.

National Education Commission [NEC]. (2014). *Study on Evaluation & the Assessment System in General Education in Sri Lanka*. Colombo: NEC.

Sachith, E. M. Y., & Niroshinie, R. D. C. (2025). *Global Trends in School-Based Assessment: Implications for Effective Implementation in Sri Lanka*. *ResearchGate*.

Wijeratne, C. D. S. P. (2021). *A Study on SBA Literacy of ESL Teachers in Sri Lanka*. Department of Examinations: Asia e University Repository.